ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01. ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

පුවත්පත් නිවේදනය

නිකුත් කළේ	**ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව**
දිනය	**2020 අප්‍රේල් මස 28 දින**

ශ්‍රී ලංකා මහ බැංකුව 2019 වසර සඳහා වන සිය වාර්ෂික වාර්තාව නිකුත් කරයි

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 35 වන වගන්තියට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ 70 වැනි වාර්ෂික වාර්තාව මහ බැංකු අධිපති, දේශමාන්‍ය මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන් මහතා විසින් ගරු අග්‍රමාත්‍ය සහ මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙත පිළිගන්වන ලදී.

[ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති, දේශමාන්‍ය මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන් මහතා විසින් 2019 වසර සඳහා වූ වාර්ෂික වාර්තාව ගරු අග්‍රාමාත්‍ය, මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙත පිළිගැන්වීම. ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා සහ ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ ආචාර්ය චන්ද්‍රනාත් අමරසේකර මහතා ද ඡායාරූපයේ වෙති.]

ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවෙන් පිළිබිඹු වන 2019 වසරේ ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

සමස්ත නිරීක්ෂණ

ශ්‍රී ලංකා ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය, 2019 වසරේ මූර්ත වර්ධනය පිළිබඳව සලකා බැලීමේ දී තවදුරටත් දුර්වල තත්ත්වයක පැවතුණු නමුත්, සාර්ව ආර්ථික ස්ථායීකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් විදේශ අංශයේ අසමතුලිතතා යම් තරමකට නිවැරදි වූ අතර උද්ධමන පීඩනයන් සාමාන්‍යයෙන් පහළ මට්ටමක පැවතුණි. පාස්කු ඉරු දින සිදු වූ ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් සංචාරක අංශය වෙත දැඩි බලපෑමක් එල්ල වූ අතර, මන්දගාමී ආර්ථික වර්ධනය වඩාත් අයහපත් තත්ත්වයකට පත් කරමින් සහ ව්‍යාපාර විශ්වාසය තවදුරටත් අඩු කරමින් එම ප්‍රහාරයන්හි අහිතකර ප්‍රතිඵල සමස්ත ආර්ථිකය කෙරෙහි ම බලපෑම් ඇති කළේය. 2019 වසර තුළ දී ගෙවුම් තුලනය සහ විනිමය අනුපාතිකය මත වූ පීඩන අඩු කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, එම ක්‍රියාමාර්ග සහ ආර්ථිකය නැවත නගා සිටුවීම සඳහා ගන්නා ලද පියවර රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය සැලකිය යුතු ලෙස දුර්වල වීමට හේතු විය. සමාහාර ඉල්ලුම මන්දගාමීව පැවතීම හේතුවෙන් වසර තුළ දී උද්ධමනය තවදුරටත් පහළ මට්ටමක පැවතුණ අතර, අයහපත් කාලගුණික තත්ත්වයන්ගේ බලපෑමෙන් දේශීය ආහාර සැපයුම්වලට වූ බාධා හේතුවෙන් පාරිභෝගික මිල ගණන්වල යම් විචලනයක් ඇති විය. මන්දගාමී ආර්ථික ක්‍රියාකාරිත්වය සහ ව්‍යාපාර විශ්වාසය දුර්වල වීම හේතුවෙන් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණයෙහි වර්ධනය සැලකිය යුතු ලෙස අඩු වූ අතර, එය මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. උද්ධමනය පහළ මට්ටමක පැවතීම, උද්ධමන අපේක්ෂාවන් මනාව පාලනය වී තිබීම සහ විදේශීය අංශය මත වූ පීඩන අඩුවීම මධ්‍යයේ ආර්ථික ක්‍රියාකාරිත්වයට සහාය වීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් ඇරඹූ අතර, වෙළඳපොළ පොලී අනුපාතික අඩු කිරීම අරමුණු කරගත් නියාමන ක්‍රියාමාර්ග ඔස්සේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වීම කඩිනම් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.

සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය (2015-2019)

දර්ශකය	ඒකකය	2015	2016	2017	2018 (අ)	2019 (ආ)
මූර්ත අංශය (ඇ)						
මූර්ත ද.දේ.නි. වර්ධනය	සියයට	5.0	4.5	3.6 (අ)	3.3 (ආ)	2.3
පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි.	රුපියල් බිලියන	10,951	11,996	13,328 (අ)	14,366 (ආ)	15,016
ඒක පුද්ගල ද.දේ.නි. (ඈ)	එ.ජ. ඩොලර්	3,842	3,886	4,077 (අ)	4,079 (ආ)	3,852
විදේශීය අංශය						
වෙළඳ ශේෂය (ඇ)	ද.දේ.නි.යේ % වශයෙන්	-10.4	-10.8	-11.0 (අ)	-11.7	-9.5
ජංගම ගිණුමේ ශේෂය (ඇ)	ද.දේ.නි.යේ % වශයෙන්	-2.3	-2.1	-2.6	-3.2	-2.2
සමස්ත ශේෂය	එ.ජ. ඩොලර් මිලියන	-1,489	-500	2,068	-1,103	377
විදේශීය නිල සංචිත	එ.ජ. ඩොලර් මිලියන	7,304	6,019	7,959	6,919	7,642
රාජ්‍ය මූල්‍ය අංශය (ඇ) (ඉ)						
වර්තන ගිණුමේ ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-2.3	-0.6	-0.7	-1.2	-2.7
ප්‍රාථමික ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-2.9	-0.2	0.02	0.6	-0.8
සමස්ත අයවැය ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-7.6	-5.3	-5.5	-5.3	-6.8
මධ්‍යම රජයේ ණය (ඊ)	ද.දේ.නි.යේ % වශයෙන්	78.5	79.0	77.9	83.7	86.8
මුදල් අංශය සහ උද්ධමනය						
පුළුල් මුදල් වර්ධනය (M_{2b}) (උ)	සියයට	17.8	18.4	16.7	13.0	7.0
පෞද්ගලික අංශයට ලබාදුන් ණය වර්ධනය (M_{2b} හි) (උ)	සියයට	25.0	21.6	14.7	15.9	4.3
වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකය (ඌ)	සියයට	2.2	4.0	6.6	4.3	4.3

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඈ) නවතම ජනගහන සංඛ්‍යා දත්ත අනුව ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත.
(ඉ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2020 මාර්තු 31 දින නිකුත් කරන ලද 2017 සහ 2018 සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඊ) 2003 නොවැම්බර් මාසයේ දී සමූපකාර තොග වෙළඳ සංස්ථාව (ස.තො.ස.) වෙත නිකුත් කරන ලද රුපියල් මිලියන 4,397ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (2016 නොවැම්බර් 14 දින කල්පිරුණි), 2013 මාර්තු මාසයේ දී ශ්‍රීලංකන් ගුවන් සේවයට ප්‍රාග්ධනය සැපයීම සඳහා නිකුත් කරන ලද රුපියල් මිලියන 13,125ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (2018 ජූනි 01 දින කල්පිරුණි) සහ 2012 ජනවාරි මාසයේ දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට (ලං.ඛ.නී.ස.) හිඟව පැවති ණය පියවීම සඳහා නිකුත් කරන ලද රුපියල් මිලියන 78,441ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (එයින් 2017 ජනවාරි 01 දින රුපියල් මිලියන 21,778ක් වටිනා බැඳුම්කර කල්පිරීම නිසා දැනට නොපියවූ ප්‍රමාණය රුපියල් මිලියන 56,662කි) ඇතුළත් වේ.
(උ) වසර අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය
(ඌ) කො.පා.මි. දර්ශකය (2013=100) මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

සාර්ව ආර්ථික ඉදිරි දැක්ම

ආර්ථිකය නැවත නගා සිටුවීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල සහ ව්‍යාපාරික ප්‍රජාවගේ විශ්වාසය ඉහළ නැංවෙන බව 2020 වසර ආරම්භයේ දී දේශීය ආර්ථික ක්‍රියාකාරකම් තුළින් පෙන්නුම් කළද, කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීම, ශ්‍රී ලංකාව ඇතුළු සියලු රටවල් විසින් අනුගමනය කරන ලද පාලන ක්‍රියාමාර්ග සහ එහි ප්‍රතිඵලයක් ලෙස ගෝලීය ආර්ථිකයේ පුරෝකතනය කර ඇති පිරිහීම හේතුවෙන් 2020 වසරේ දී රටෙහි ආර්ථික ක්‍රියාකාරිත්වය පිළිබඳව තවදුරටත් අවිනිශ්චිතතා ඇති කළේය. මෙමගින්, නුදුරු අනාගතයේ ආර්ථිකයේ සියලු පාර්ශ්වකරුවන්ට දුෂ්කරතා ඇති කරමින් ආර්ථික වර්ධනය, රාජ්‍ය මූල්‍ය, විදේශීය සහ මූල්‍ය අංශවල කාර්යසාධනය මත දැඩි බලපෑම් එල්ලවීමට ඉඩ ඇත. පහළ උද්ධමන වාතාවරණය හමුවේ මුදල් ප්‍රතිපත්ති ලිහිල්කරණය සඳහා පැවති අවකාශය සහ බැංකු අංශයේ සම්මත මට්ටමට වඩා ඉහළින් පවත්වාගෙන යන ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂණ මගින් ඇති බැංකු අංශයේ අවකාශය හේතුවෙන්, ව්‍යාපාර මෙන්ම පුද්ගලයන් මුහුණ දෙන අපහසුතා අවම කිරීම සඳහා වූ රජයේ ප්‍රයත්නවලට සහාය වීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකියාව ලැබුණි. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ආර්ථිකයේ තාවකාලික

පසුබෑමක් ඇති වුවද, දිගුකාලීනව පැවති ව්‍යුහාත්මක ගැටලු විසඳීම සහ දේශීය නිෂ්පාදනය පුළුල් කිරීම, අපනයන ඉහළ නැංවීම, විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම, නවෝත්පාදන සඳහා පහසුකම් සැලසීම, නිෂ්පාදන සාධකවල ඵලදායීතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ අවශ්‍ය අවස්ථාවන්හි දී උපයෝගී කරගැනීමට හැකි ලෙස ප්‍රතිපත්ති අවකාශයන් සම්පාදනය තුළින් ආර්ථික වර්ධනය සඳහා සහාය වන ප්‍රතිසංස්කරණ ප්‍රමාදයකින් තොරව ක්‍රියාවට නැංවුවහොත් ඉදිරියේ දී තිරසර හා සැමට ප්‍රතිලාභ ලැබෙන ආකාරයේ ආර්ථික ප්‍රගතියක් අත්පත් කර ගැනීම සහ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම යන අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමට ශ්‍රී ලංකාවට හැකිවනු ඇත.

මැදි කාලීන සාර්ව ආර්ථික රාමුව (අ)

දර්ශකය	ඒකකය	2018 (ආ)	2019 (ඇ)	ප්‍රරෝකථන				
				2020	2021	2022	2023	2024
මූර්ත අංශය (ඈ)								
මූර්ත ද.දේ.නි. වර්ධනය	සියයට	3.3 (ඇ)	2.3	1.5	4.5	6.0	6.2	6.5
පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි.	රුපියල් බිලියන	14,366 (ඇ)	15,016	15,925	17,466	19,443	21,690	24,245
ඒක පුද්ගල ද.දේ.නි.	එ.ජ. ඩොලර්	4,079 (ඇ)(ඉ)	3,852	3,940	4,166	4,473	4,813	5,190
මුළු ආයෝජන	ද.දේ.නි.යේ % වශයෙන්	30.4 (ඇ)(ඊ)	27.4	26.8	27.3	27.8	28.1	28.4
දේශීය ඉතුරුම්	ද.දේ.නි.යේ % වශයෙන්	23.0 (ඇ)(ඊ)	21.3	20.7	21.3	22.5	23.6	24.5
ජාතික ඉතුරුම්	ද.දේ.නි.යේ % වශයෙන්	27.3 (ඇ)(ඊ)	25.3	23.7	24.7	25.6	26.2	26.8
විදේශීය අංශය								
වෙළඳ පරතරය (ඈ)	ද.දේ.නි.යේ % වශයෙන්	-11.7	-9.5	-7.7	-9.8	-9.7	-9.5	-9.2
අපනයන	එ.ජ. ඩොලර් මිලියන	11,890	11,940	8,740	11,117	12,421	13,594	15,380
ආනයන	එ.ජ. ඩොලර් මිලියන	22,233	19,937	15,415	20,135	22,092	23,815	26,135
ජංගම ගිණුමේ ශේෂය (ඈ)	ද.දේ.නි.යේ % වශයෙන්	-3.2	-2.2	-3.1	-2.6	-2.2	-1.9	-1.6
විදේශීය නිල සංචිත	ආනයනික මාස වශයෙන්	3.7	4.6	5.6	4.6	4.6	4.6	4.6
රාජ්‍ය මූල්‍ය අංශය (ඈ)								
සමස්ත ආදායම් සහ ප්‍රදාන	ද.දේ.නි.යේ % වශයෙන්	13.5 (උ)	12.6	9.8	11.8	13.5	14.1	14.5
වියදම හා ශුද්ධ ණය දීම්	ද.දේ.නි.යේ % වශයෙන්	18.7 (උ)	19.4	17.7	18.6	19.1	19.2	19.4
වර්තන ගිණුමේ ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-1.2 (උ)	-2.7	-5.1	-3.6	-2.1	-1.5	-1.0
ප්‍රාථමික ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	0.6 (උ)	-0.8	-2.8	-1.0	0.5	0.7	1.1
සමස්ත අයවැය හිඟය	ද.දේ.නි.යේ % වශයෙන්	-5.3 (උ)	-6.8	-7.9	-6.8	-5.6	-5.2	-4.9
මධ්‍යම රජයේ ණය	ද.දේ.නි.යේ % වශයෙන්	83.7 (උ)	86.8	92.4	89.4	84.3	80.5	76.3
මුදල් අංශය සහ උද්ධමනය								
පුළුල් මුදල් වර්ධනය (M_{2b}) (ඌ)	සියයට	13.0	7.0	9.3	12.9	12.7	12.5	12.5
පෞද්ගලික අංශයට ලබාදුන් ණය වර්ධනය (M_{2b} හි) (ඌ)	සියයට	15.9	4.3	4.0	10.0	12.2	13.0	13.0
වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (එ)	සියයට	4.3	4.3	4.5	5.0	5.0	5.0	5.0

(අ) 2020 මාර්තු මස අවසානය වන විට පැවති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඉ) නවතම ජනගහන සංඛ්‍යා දත්ත අනුව ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත.
(ඊ) 2018 වසර සඳහා ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින්, 28.6%, 21.2% සහ 25.4% ක් වූ මුළු ආයෝජන, දේශීය ඉතුරුම් සහ ජාතික ඉතුරුම් පිළිබඳ දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කරන ලදී.
(උ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2020 මාර්තු 31 දින නිකුත් කරන ලද 2018 සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඌ) වසර අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය
(එ) කො.පා.මි. දර්ශකය (2013 = 100) මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

සාර්ව ආර්ථික සංවර්ධනයන්

මූර්ත අංශයේ වර්ධනයන්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලැබූ ද.දේ.නි.යේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, ශ්‍රී ලංකා ආර්ථිකය 2018 වසරේ දී වාර්තා කළ සියයට 3.3ක වර්ධනයට සාපේක්ෂව 2019 වසරේදී සියයට 2.3ක අඩු වර්ධනයක් වාර්තා කළේය. ආර්ථිකයේ සියලුම ප්‍රධාන අංශ ධනාත්මක නමුත් අඩු වර්ධන වේගයක් වාර්තා කළේය.



වියදම් ප්‍රවේශය මත පදනම් වූ ද.දේ.නි.යේ ඇස්තමේන්තුවලට අනුව, පරිභෝජන වියදම් ඉහළ යෑම සහ විදේශීය අංශයේ භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය වර්ධනය වීම 2019 වසරේ ආර්ථික වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.



2019 වසරේ ජාතික නිෂ්පාදිතය, වියදම හා ආදායම සංක්ෂිප්තයක් ලෙස



රජය, පෞද්ගලික අංශයේද සහයෝගිත්වය ඇතිව

2019 වසරේ දී ද අඛණ්ඩ ව ආර්ථික සහ සමාජ යටිතල පහසුකම් සැලසීමේ නිරත විය.

ආර්ථික යටිතල පහසුකම්

පාස්කු ඉරිදා ප්‍රහාරවලින් සමස්ත ප්‍රවාහන අංශයටම සැලකියයුතු බලපෑමක් එල්ල විය...



වියළි කාලගුණික තත්ත්ව මධ්‍යයේ ඉන්ධන මගින් විදුලිබල උත්පාදනය කිරීම මත වැඩි වශයෙන් යැපීම නිසා විදුලිබල උත්පාදනය සඳහා සිදුකළ ඛනිජ තෙල් අලෙවිය ඉහළ ගියේය..

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි ඛනිජ තෙල් අලෙවියෙහි වාර්ෂික වර්ධනය

විදුලිබලය



ලං.වි.ම. විදුලිබල අලෙවිය

2019 මාර්තු සහ අප්‍රේල් මාසවල දී සැලසුම් කළ විදුලි කප්පාදු කිරීම් මධ්‍යයේ වසරේ විදුලිබල අලෙවිය සුළු වර්ධනයක් වාර්තා කළේය.

වරාය ක්‍රියාකාරිත්වය



වරාය ක්‍රියාකාරකම් **2019 වසරේ දී** වර්ධනයක් පිළිබිඹු කළේය.

විදුලි සංදේශ



පුද්ගලයින් 100කට ඇති සම්බන්ධතා සංඛ්‍යාව මගින් නිරූපිත ඝනත්වය

සමාජ යටිතල පහසුකම්

සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා රජයේ වියදම ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින් සියයට 1.6ක් සහ සියයට 1.9ක් විය.

රජයේ රෝහල්වල

- පුද්ගලයින් 1,000කට ඇඳන් 3.6
- පුද්ගලයින් 1,203කට එක් වෛද්‍යවරයෙකු
- පුද්ගලයින් 570කට එක් හෙද සේවකයෙකු

සමෘද්ධි සහනාධාරය

සමස්ථ ගෙවීම් ප්‍රමාණය 2018 වසරේ පැවති රු.බිලියන 39.2 සිට 2019 වසරේ දී රු.බිලියන 44.7ක් දක්වා වැඩි විය.

සමෘද්ධි ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව 2018 වසරේ පැවති මිලියන 1.4 සිට 2019 වසරේ දී මිලියන 1.8ක් දක්වා ඉහළ ගියේය.

2019
2018

සාක්ෂරතාව

2018 වසරේ සාක්ෂරතාව 2017 වසරේ පැවති සියයට 92.6ට සාපේක්ෂව සුළු වශයෙන් පහළ ගියේය.



මන්දගාමී වූ ආර්ථික ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරමින් 2018 වසරේ දී සියයට 4.4 ක් වූ රැකියා වියුක්තිය 2019 වසරේ දී සියයට 4.8ක් දක්වා ඉහළ ගියේය. 2018 වසරේ දී, පිළිවෙළින්, සියයට 3.0ක් සහ සියයට 7.1ක් වූ පුරුෂ හා ස්ත්‍රී රැකියා වියුක්ති අනුපාතික 2019 වසරේ දී, පිළිවෙළින්, සියයට 3.3ක් සහ සියයට 7.4ක් දක්වා ඉහළ ගියේය.

සේවා වියුක්ති අනුපාතිකය



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ශ්‍රම වෙළඳපොළ - 2019 (අ)



(අ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

උද්ධමනය

සැපයුම් පාර්ශ්වයේ මතු වූ තාවකාලික බාධා මධ්‍යයේ වුවද, මූලික වශයෙන් ඉල්ලුම් තත්ත්වයන් මන්දගාමී වීම සහ උද්ධමන අපේක්ෂා මනා ලෙස පාලනය කිරීම හේතුවෙන් 2019 වසරේ ද මතුපිට උද්ධමනය මෙන්ම මූලික උද්ධමනය ද අපේක්ෂිත සියයට 4-6 අතර පරාසය තුළ විචලනය විය.

මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය)



තෝරා ගත් ආහාර සහ ආහාර නොවන අයිතමවල මිල විචලන - 2019

විදේශ අංශයේ වර්ධනයන්

ආනයන වියදම අඩු කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතුවෙන්, වෙළඳ සහ ජංගම ගිණුම්වල ශේෂයන් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. 2019 වසරේ දී රජය විසින් විදේශීය ව්‍යවහාර මුදල්වලින් සිදු කරන ලද ඉහළ ප්‍රමාණයක ණය සේවාකරණ ගෙවීම හමුවේ වුවද, රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සැලකිය යුතු ප්‍රමාණයක විදේශ විනිමය ලැබීම හේතුවෙන් 2019 වසර අවසානය වන විට දළ නිල සංචිත වර්ධනය විය. 2019 වසරේ දී දේශීය හා ගෝලීය ප්‍රවණතාවලට ප්‍රතිචාර දක්වමින් විවිධ ආයෝජන ගෙවීම් හමුවේ යම් තාවකාලික විචලතාවක් පෙන්නුම් කළ ද ජංගම ගිණුමේ සැලකිය යුතු වර්ධනය හේතුවෙන් විනිමය අනුපාතිකය සමස්තයක් වශයෙන් ස්ථාවරව පැවතුණි.

ගෙවුම් තුලනය



දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මහ බැංකුවේ
මැදිහත්වීම හා විනිමය අනුපාතිකය



ස්ථාවර විනිමය අනුපාතිකයක් පැවතීම සහ ජංගම ගිණුමේ හිඟය අඩු වීම සමඟ 2019 වසරේ දී විදේශීය අංශය බාහිර අවදානම්වලට සාර්ථකව මුහුණ දුන්නේය...



2019 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශීය වෙළඳාමේ ක්‍රියාකාරිත්වය සැලකිය යුතු වර්ධනයක් පිළිබිඹු කළේය...

- ආනයන සැලකිය යුතු ලෙස අඩු විය
- අපනයන සුළු වශයෙන් වර්ධනය විය

...මේ හේතුවෙන් **වෙළඳ හිඟය** 2018 වසර සමඟ සැසඳීමේ දී එ.ජ. ඩොලර් බිලියන 2.3කින් සැලකිය යුතු ලෙස අඩු විය.







පාස්කු ඉරු දින ප්‍රහාර හේතුවෙන් **සංචාරක අංශය** විශාල පසුබෑමකට ලක් වුවද, නැවත අපේක්ෂිත මට්ටම කරා වේගයෙන් යථා තත්ත්වයට පත් වීමක් නිරීක්ෂණය විය...



★ 2018 දත්ත කුඩා ස්ථම්භ වලින් නිරූපණය වේ.

ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය නොවෙනස්ව පවතින අතරතුර සේවා ගිණුම වෙත වූ ලැබීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ අඩු වුවද, **ජංගම ගිණුමේ හිඟය** 2019 වසරේදී සැලකිය යුතු ලෙස අඩු වුයේ...

-2.8 එ.ජ.ඩො. බිලියන (2018)

-1.8 එ.ජ.ඩො. බිලියන (2019)

...ප්‍රධාන වශයෙන් වෙළෙඳ හිඟය අඩුවීම හේතුවෙනි.

වසර තුළ දී **මූල්‍ය ගිණුම** වෙත සැලකිය යුතු ලැබීම් නිරීක්ෂණය විය...



...ඒ අනුව **දළ නිල සංචිත** ඉහළ ගියේය.



කොවිඩ්-19 වසංගතය පැතිරීම හේතුවෙන් ප්‍රධාන වශයෙන් අපනයන, සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වෙත බලපෑමක් ඇති වීම තුළින් 2020 වසරේ දී විදේශීය අංශයට සැලකිය යුතු අභියෝගවලට මුහුණපෑමට සිදු වනු ඇත.

රාජ්‍ය මූල්‍ය අංශයේ වර්ධනයන්

රාජ්‍ය ආදායමේ කැපී පෙනෙන අඩු වීම සහ රජයේ වියදම් ඉහළ යෑම මධ්‍යයේ, 2019 වසරේ දී රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය සැලකිය යුතු අභියෝගවලට ලක්විය.

රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයෙහි සාරාංශය
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



මූලය: මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

මධ්‍යම රජයේ ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2018 වසර අවසානයට පැවති සියයට 83.7ක සිට 2019 වසර අවසානයේ දී සියයට 86.8ක් දක්වා වැඩි විය. ප්‍රධාන වශයෙන්, අයවැය හිඟය පියවා ගැනීම සඳහා ශුද්ධ ණය ගැනීම්වල වැඩි වීම සහ 2019 වසරේ දී සාපේක්ෂව නාමික ද.දේ.නි.යේ වූ මන්දගාමී වර්ධනය මෙම වැඩි වීම සඳහා හේතු විය.

මධ්‍යම රජයේ ණය
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



මූලයන්: මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය



මුදල් අංශයේ වර්ධනයන්

ඉල්ලුමෙන් ඇතිවන උද්ධමන පීඩන අඩු මට්ටමක පවතින සහ මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂාවන් පවතින වාතාවරණයක් තුළ ආර්ථික කටයුතු යළි නගා සිටුවීමට සහාය වීම සහ පෞද්ගලික අංශයට සපයන ලද ණයෙහි මන්දගාමී වර්ධනය සඳහා විසඳුම් ලබාදීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුව 2019 වසර තුළ දී ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කළේය.

නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව සහ තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතික



බැංකු අංශයේ ශුද්ධ දේශීය වත්කම් වර්ධනය මන්දගාමී වීමත් සමඟ 2019 වසර තුළ දී පුළුල් මුදල් සැපයුමේ (M_{2b}) වර්ධනය අඛණ්ඩව පහළ ගියේය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් තත්ත්වය ලිහිල් කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් වසරේ අවසාන කාලය තුළ දී පෞද්ගලික අංශයට සපයන ලද ණය ප්‍රමාණය යථා තත්ත්වයට පත්වීමක් දක්නට ලැබුණ ද, වෙළඳපොළෙහි ඉහළ මට්ටමක පැවතුණු පොලී අනුපාතික, ප්‍රතිපත්ති අවිනිශ්චිතතාව, විශේෂයෙන්ම පාස්කු ඉරු දින ප්‍රහාරවලින් අනතුරුව දුර්වල වූ ආයෝජක විශ්වාසය සහ වසර තුළ පැවති මන්දගාමී ආර්ථික කටයුතු මධ්‍යයේ 2019 වසර තුළ දී පෞද්ගලික අංශයට සපයන ලද ණය වර්ධනය මන්දගාමී විය.

පුළුල් මුදල් වර්ධනය හා තුඩුදුන් සාධක



වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සපයන ලද ණය



ආර්ථික ක්‍රියාකාරකම් යළි නගා සිටුවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 2019 මැයි මාසයේදී ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් ක්‍රියාවට නැංවූ අතර, 2019 අගෝස්තු මාසයේදී සහ 2020 මුල් කාලය තුළදී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් ලිහිල් කළේය...

පහළ උද්ධමනය, මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂා, සාපේක්ෂ වශයෙන් ස්ථාවර විදේශ අංශය සහ වඩාත් ලිහිල් වූ ගෝලීය මුදල් ප්‍රතිපත්ති යනාදියෙහි සහාය ලබමින්...



ණය සැපයුම වර්ධනය කිරීම තුළින් විභව මට්ටමට වඩා පහළින් පවතින ආර්ථික වර්ධනය යළි නගා සිටුවීම සඳහා 2019 වසර තුළදී සහ 2020 වසරේ මුල් කාලය තුළදී ගනු ලැබූ ප්‍රතිපත්ති සහ නියාමන ක්‍රියාමාර්ග...



වෙළඳපොළ පොලී අනුපාතිකවල සැලකිය යුතු පහළ යෑමක් දක්නට ලැබුණි...



වාර්ෂික ලක්ෂ්‍යමය ණය වර්ධනයේ මන්දගාමීවීමක්...

	2018	2019
පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය	15.9 %	4.3 %
රාජ්‍ය සංස්ථා වෙත සපයන ලද ණය	40.7 %	8.3 %
රජය වෙත සපයන ලද ශුද්ධ ණය	16.1 %	9.9 %

මන්දගාමී වූ මුදල් සමස්ත...

2018 13%

2019 7%

පුළුල් මුදල් සැපයුමේ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය

2019 වසර තුළ දී පාරිභෝගික මිල උද්ධමනය· පුළුල් වශයෙන් අඩු මට්ටමක පැවතුණි...

කෙසේ වෙතත්, ඉහළ ආහාර උද්ධමනයත් සමග 2020 මුල් කාලයේදී උද්ධමනය ඉහළ ගියේය...



*වාර්ෂික ලක්ෂ්‍යමය කො.පා.මි.ද මතුපිට උද්ධමනයේ හැසිරීම

මූලික උද්ධමනය 2019 වසර මුළුල්ලේ අඛණ්ඩව ස්ථාවරව පැවතුණි...

උද්ධමනය මැදි කාලීනව මැද තනි අගයක මට්ටමේ ස්ථාවරව පවත්වා ගැනීම සහ එමගින් ආර්ථික වර්ධනය එහි විභව මට්ටමට ළඟාවීමට සහාය වීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්තිය නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවකට අනුකූලව ක්‍රියාත්මක කළේය.

මූල්‍ය අංශයේ වර්ධනයන්

පහළ මට්ටමක පැවති ආර්ථික වර්ධනය, ප්‍රතිපත්ති අවිනිශ්චිතතාව සහ පාස්කු ඉරු දින ප්‍රහාර නිසා ආයෝජකයින්ගේ විශ්වාසය පිරිහීම හේතුවෙන් ඇති වූ අභියෝගාත්මක ව්‍යාපාරික වාතාවරණය හේතුවෙන් වත්කම් පදනම, ණයවල ගුණාත්මකභාවය සහ මූල්‍ය ආයතනවල ඵලදායීතාව යන කරුණු අනුව මූල්‍ය අංශයේ කාර්යසාධනය මන්දගාමී විය. ණය සඳහා වූ අඩු ඉල්ලුම සහ ණයවල ගුණාත්මකභාවය පිරිහෙන වාතාවරණයක ණය පිළිබඳ පිරික්සා බැලීම ඉහළ නැංවීම යනාදී කරුණු හේතුකොටගෙන මූල්‍ය අංශයේ ප්‍රමුඛස්ථානය දරන බැංකු අංශය, පෙර වසරට සාපේක්ෂව මෙම වසරේ දී මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කළේය. අහිතකර වෙළඳපොළ තත්ත්වයන් සහ අංශයේ පවතින දුර්වලතා හේතුවෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල කාර්යසාධනය පහළ ගියේය. මේ අතර, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම වෙනුවෙන් ශ්‍රී ලංකාව ලබා ඇති සැලකිය යුතු ප්‍රගතිය සලකා බලා මූල්‍ය කාර්යසාධන බලකාය විසින් 2019 ඔක්තෝබර් මාසයේ දී ශ්‍රී ලංකාව එහි අළු ලේඛනයෙන් ඉවත් කරන ලදී.

මූල්‍ය අංශයේ වත්කම් සංයුතිය සහ තෝරාගත් දර්ශක



මෑත කාලීන වර්ධනයන් සහ කාලීන ගැටලු පිළිබඳ විශේෂ සටහන් ලැයිස්තුව

2019 වාර්ෂික වාර්තාවේ ඇතුළත් පහත දැක්වෙන විශේෂ සටහන් මගින් 1 වෙනි පරිච්ඡේදයෙහි 1.5 කොටසෙහි අවධාරණය කළ ගැටලු සහ අභියෝගවලට අමතරව, මෑත කාලීන වර්ධනයන් සහ කාලීන ගැටලු පිළිබඳව විශ්ලේෂණය කරයි.

1. ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් කාණ්ඩයේ රටක තත්ත්වයට උසස් වීම
2. කොවිඩ්-19 සහ ශ්‍රී ලංකාව: අභියෝග, ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ ඉදිරි දැක්ම
3. ශ්‍රී ලංකාවේ ආර්ථික උඩ්ඩායනය (Takeoff) - අවශ්‍යතාව සහ සූදානම
4. කෘෂිකාර්මාන්තය සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීම
5. ගිග් ආර්ථිකයේ නැගී ඒම සහ ඒ හා බැඳුණු අභියෝග
6. තිරසාර වර්ධනය හා සංවර්ධනය බල ගැන්වීම
7. මැදි ආදායම් උගුලෙන් මිදීම සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණය
8. ඒකාකෘතිකතා බිඳ දැමීම: ඩිජිටල්කරණය සාම්ප්‍රදායික සංඛ්‍යාන ක්‍රියාවලියට බලපාන්නේ කෙසේද?
9. පාස්කු ඉරු දින ප්‍රහාරයේ බලපෑම
10. රාජ්‍ය ආදායම පහළ මට්ටමක පැවතීම මධ්‍යයෙහි ඵලදායී ලෙස රජයේ වියදම කළමනාකරණය කිරීමේ වැදගත්කම
11. සමානුපාතිකත්වය: නියාමනයන්, බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර ආකෘතීන් සමඟ අනුගත කිරීම
12. රජයේ සුරැකුම්පත්වල ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු ප්‍රමිතිගත කිරීම
13. ශ්‍රී ලංකාව තුළ අවිධිමත් ලෙස ක්‍රියාත්මක වන මුදල් ණයට දීමේ ව්‍යාපාර නියාමනය කිරීමේ අවශ්‍යතාවය
14. ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග: 2019